
සිහිනයක් සේ
ජීවිතයට ඇවිත් යන මිනිසුන්
වගීෂා ජයරත්න

# සිහිනයක් සේ

ජීවිතයට ඇවිත් යන මිනිසුන්


# වගීෂා ජයරත්න

කතෘ


වෙනත් කෘති

- සතුටු කඳුලු


මහාමායා බාලිකා විද්‍යාලය

10 B



2026. 06. 10

ISBN - 978- 624 -211 -439- 2

# පිදුම

මගේ ආදරණීය
අම්මිටත් අප්පච්චීටත්,
ගුරුවරුන්ටත්,
මිතුරන්ටත් උදව් කළ
සැමටත් ආදරයෙන්
පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

# 01.

අනේ ඔහොම පොඩ්ඩක් ඉන්න ... මම එනකන් ඉන්න. ආහ් අදත් පරක්කු වෙයි. ඔහොම පොඩ්ඩක් ඉන්න අනේ දෙවියනේ මම වොච් එකත් දාල ඇවිත්...

මම ඉශාරා තාරින්දි . පුංචි කාලේ ඉඳල ම මම ජීවත් උනේ කොළඹ, කලම්බො හෝම් අනාත නිවාසේ. ඔව් මම මගේ අම්මයි තාත්තයි කව්ද කියලාදන්නේ නැහැ. . හ්ම්ම් හහ්.......

දැන් ඒවගෙන් වැඩක් නෑ. මම කොහොමහරි වෙලාවට කැම්පස් එකට යන්න ඕනි.

මගේ වෙලාවට බස් එකක් එනවා.

*****

තාරී මොකද වෙලා ගියේ. මම ඔයා එනකන් ගොඩක් වෙලා බලන් හිටියා.

අනේ සොරි මෙතු මට අද බස් එක මිස් උනානේ මම ඊලග බස් එකේ තමයි ආවේ.

අනේ ඉතින් මොකට කියනවද මගේ කට හොදයි. මම හැමදාම කියනව නේද වෙලාවට වැඩක් කරන්න ඉගෙන ගන්න කියලා.

සොරි ටීචර් මම ආය වෙලාවට නැගිටින්නම්කෝ හරිද?

හරි හරි දැන් යමුකෝ ලෙක්චර් හෝල් එකට.

ඒ මගේ හොදම යාලුවා මෙතුලිනී. එයාලගෙ ගෙවල් නුවර. දැන් කැම්පස් නිසා නැවතිලා ඉන්නේ නැන්දලාගේ ගෙදර. අපි දෙන්නම ඉන්ජිනියර් ෆැකල්ටි එකේ. මට ම කියලා කව්රුත් නැති මේ කොළඹ රටේ මට කියලා ඉන්න අතළොස්සෙන් විශ්වාසවන්ත ම කෙනෙක් තමයි මෙතුලිනී. සංසාර පුරුද්ද ද කොහෙද ,කොහේදෝ ඉදලා ඇවිල්ලා මගේ ලග හැම දේකට ම ඉන්නේ මෙතු තමයි.

*****

අද තමයි අපේ මේ ඉයර් එකේ ලාස්ට් ඩේ එක ඒ කියන්නේ අදින් පස්සේ අලුත් අවුරුදු නිවාඩුව. ඉතින් මෙතු මට මේ නිවාඩුවට එයාලගේ ගෙදර එන්න කිව්වා. කාත් කව්රුවත් නැති මට නෑදැයෝ කවුරුත් හිටියේ නෑ. ඉතින් මම ජීවිතේ පලවෙනි වතාවට ඇත්තම ගෙදරකට යනවා. මම බෝඩිමට ගොස් බලා සිටියේ මෙතුගෙන් කෝල් එකක් එනතුරුයි. බෝඩිමේ මාත් එක්ක ඉන්න අදිතිත් හෙට මාතර එයාගේ ගෙදර යනවා. ඒ නිසා බෝඩිමේ ආන්ටිත් ලෑස්ති උණා රත්නපුර මහ ගෙදර යන්න.

අලුත් අවුරුද්ද කියන්නේ මුළු කොළඹ ම හිස් වෙන කාලයක්. කොළඹ ම පදිංචි වුනු අය ඇරුනා ම අනිත් හැම කෙනා ම ගම හොයන් යන්නේ අවුරුදු සමරන්න. ගහකොළ පිරුනු නිදහස් නිස්කලංක ගමක්, තමන් වෙනුවෙන් මග බලන් ඉන්න පවුලක් ලබන එකත් හරිම

වාසනාවක්. ටික වෙලාවකින් කාර් එකක හෝන් සද්දයක් එක්ක මෙතුගෙන් කෝල් එකක් ආවා. මම ගේට් එක ගාවට යනකොට මෙතුලගේ කාර් එක නවත්තලයි තිබුණේ. බෝඩිමේ ආන්ටිටත් යන්නම් කියලා මම කාර් එකට නැංගේ මහත් සතුටිනි.

" කොහොමද තාරින්දි දුව, ගොඩ කාලෙකින්නේ දැක්කේ."

" මම හොඳින් ඉන්නවා අන්කල්'

" අනූටයි මටයි හරි ම සතුටුයි දුව අපිත් එක්ක අවුරුදු සමරන්න එනවට"

" මටත් එහෙමම තමයි අන්කල් හරිම සතුටුයි ඇත්තට ම පවුලක් එක්ක අවුරුදු සමරන්න හම්බ වෙනවට"

නුවරට එන පැය හතරක පමණ කාලයේදී මට නින්ද ගොස් තිබුණි. ගම්පහින් වැසුනු මගේ දශර්න පථය නැවත විවර උනේ සුන්දර සෙංකඩගලපුරවරයේදී ය.

" තාරින්දි දුව නැගිටින්න. දෝණී කෝ ඔයත් නැගිටින්න."

" ආ මට ටිකක් නින්ද ගියා අන්කල්."

"දෙන්නට ම ටිකක් නම් නෙවෙයි නින්ද ගියේ. පැය තුනක් විතර නිදි."

" තාරී අර කන්ද උඩ ලොකු බුදු පිළිමයක් තියෙන්නේ ඒ තමයි බහිරව කන්ද. එතකොට අර පැත්තෙන් පේන්නේ හන්තාන, ඔයාට මතකයිනේ අපි ආවේ හයිකින්ග් වලට" මෙතු කිව්වේ ඈත් පෙනෙන අලංකාර කඳු වළලු පෙන්වමිනි.

" ඔව්  අර ඔයා මඩ වලකට වැටුණු පාරනේ. මට කොහොම අමතක වෙන්න ද?"

" ඒකනේ දුව කොහේ ගියත් මච්ඡිම බඩාගන්න එකේ නම් ඉවරයක් නෑ මෙයාගේ."

" අනේ අප්පච්චී..... මම මගේ රටට ආදරෙයි තමා."

" අපිත් ආදරෙයි තමා ඒ උණාට බඩා ගන්න යන්නේ නෑ නේ නේද දුව"

" ඒකනේ අන්කල් ඔය පේන්නේ ගිය ආත්මේ ගති තවම කකුල් දෙකෙන් යන්න පුරුදු නෑ බඩගාන්න ම තමා පුරුදු.'

"හරි හරි දැන් දුවයි අන්කලුයි එක පැත්තනේ මගේ පැත්තට අම්මිවත් ඉදීනේ"

" ඔන්න දුව තව ටිකකින් දළදා මාළිගාව හම්බවෙනවා. ඊට පස්සේ වැව රවුම"

මම දෑත් එකට තබා වාම දළදා වහන්සේ වැන්දෙමි. කුවීන්ස් හෝටලය ලගින් කාරය වැව රවුම දෙසට හරවන ලදි.

" වාව් මාර ලස්සනයිනේ"

අපි සිටියේ ඉර බැස යන වේලාවේ වැව රවුමේ මල්වතු පන්සලට දෙසට යමිනි. බෝගම්බර වැවේ දිය රටාත් දළදා මාළිගාවේ පින් පාටත් ඈත් පෙනෙන මනහර කඳුවැටියත් වැව දෙසට

නැමී කොඳුරන ගස්වැලුත් කියාපෑවේ නෙත්කලු රමණීය දසුනකි. අනේ දෙවියනේ මටත් මේ ලස්සන දිව්‍යලෝකයේ නවතින්න තිබ්බානම්.

අපි වැව රවුම දෙසින් තල්වත්ත නගරයට පිවිසීමු. අතුරු පාරවල් කිහිපයකින් පසුව අපි පිවිසුනේ මනාව නඩත්තු කරන ගස් වැටියකට මැදිවූ පාරකට ය. ඒ මෙතුගේ නිවසට පිසෙන මාවතය. සුලු වේලාවකින් කාරය නැවැත්වූයේ අලංකාර නවීන පන්නයේ හුරුබුහුටි දෙමහල් නිවසක් ඉදිරිපිටය.

"තාරින්දි දූව මේ තියෙන්නේ අපේ ගෙදර. "

මම කාරයෙන් බැස වටපිට සුන්දරත්වය නැරඹුවෙමි. එවිට ගෙතුලින් මැදිවියේ කාන්තාවක් පැමිණ මෙතුලිනීව බදාගෙන මටද ආදරෙයෙන් කතා කලාය.

" ආනේ අනූ ආන්ටි මට ඔයාව අඳුරගන්නත් බැරි උණා. දැන්නම් මෙතූටත් වඩා අඩුවෙන් තමයි වයස පේන්නේ"

"ඔන්න ඔන්න අම්මී දැන් මෙයා ඔයාවත් අල්ලගන්න තමයි යන්නේ. එන ගමන් මාව කොන් කරලා දාලා හිටියේ මේ දෙන්න එකතු වෙලා."

" අයියෝ මේ ලමයි පොඩි අය වගේ රණ්ඩු වෙනවනේ, කෝ එන්න හැමෝ ම ඇතුලට "

එය ඉතා අලංකාර පිලිවෙල නිවසකි. ඔව් ඉතින් මෙතූ අච්චර පිලිවෙලවෙන්නත් හේතුවක් තියෙන්න එපැයි.

" එන්න දූව අපි කෑම කාල ම සෝදගමු. දවල්ටත් කන්නේ නැතුවනේ එන්න ඇත්තේ"

" හරී ආන්ටි."

මම කාලෙකින් කෑ රසම ආහාරය එය විය. අපි ආහාර ගෙන මද වේලවකට පසු මෙතූගේ මල්ලී පැමිණියේ දහඩිය පෙරාගෙනය. මෙතූ කියා ඇතිලෙසට ඔහු දක්ශ ක්‍රිකට් ක්‍රීඩකයෙකි. අදද පැමිනියේ සවස් වනතුරු පැවතුනු ක්‍රිකට් පුහුණුවීම්වලින් අනතුරුවය.

රෑ කෑමෙන් පසු අපි ආගිය තොරතුරු කතා කර සුන්දර චිත්‍රපටයක් නැරඹුවෙමු. එදින රාත්‍රියේ මම නින්දට ගියේ සතුටු කඳුලු පොදි බැඳගෙනයි.

*****

සොඳුරු කතාබහ සතුටු සිනා මැද්දෙන් සතියක පමණ කාලය ගෙවී ගියේ නොදැනීම ය. මට දැනුනේ මම ඔවුන්ගේ ම පවුලේ කෙනෙකු ලෙසිනි. සුලු කාලයකට වුවද එවන් සුන්දර පවුලක සාමජිකයෙක් වීමට ලැබීම මට මහත් සතුටකි. මේ කාලය අතරතුර අපි අලුත් අවුරුද්දට ගෙදර පිරිසිදු කළෙමු. කැවිලි සෑදුවෙමු.

# 02.

ඩෝං ඩෝඕඕඕං ඩෝං ඩෝං ඩෝං ඩෝඕඕඕං

"පුතාලා හැමෝ ම එන්න කුස්සියට ලිප ගිනි මොලවන නැකත ළගයි'

මමත් මෙතුත් චමිරු මල්ලීත් හිටියේ පහළ ගෙදරත් එක්ක තරගෙට රතිඤ්ඤා දමමිනි.

මෙතුලගේ පහළ ගෙදර හිටියේත් මේ වගේ ම ලස්සන පවුලක් මට වඩා අවුරුදු තුනක් වැඩිමල් අයියා කෙනෙකුයි මට වඩා අවුරුදු තුනක් බාල නංගි කෙනෙකුයි තමා එහෙ ඉන්නේ නංගි ලෝ ෆැකල්ටි සකන්ඩ් ඉයලර්ට් . අයියා දැන් ඉන්ජිනියර් කෙනෙක්ලු. ඉතින් ඔන්න මේ ලෝයර් නන්ගියි ඉන්ජිනියර් අයාායි එකතු වෙලා අපිට තරගෙට රතිඤ්ඤා දානවා.

"අපි මේ එනවා අම්මේ.... කෝ තාරින්දි අක්කේ ඕක විසි කරන්න.. " කලබලයට මම දැමූ රතිඤ්ඤය ගොස් නැවතුනේ අනූ ආන්ටිගේ සුදු රෝස මල් පඳුරේ ය. සුදු රෝස පැළේ තිබූ එකම මලේ දැන් පෙති විසිරී ගොස් ය.

" හරි දැන් තාරින්දි අක්කට තමයි අම්මගෙ රෝස මලට ඉන්න වෙන්නේ "

" ඔව් තාරි අපේ අම්මගේ මල් ගහකට අත තිබ්බා කියන්නේ ඩොනල් ට්‍රම්ප් අවුස්සගත්තා වගේ තමයි."

" අනේ මොකද කරන්නේ දැන්" මම ඇසුවේ රෝස පෙති අහුලමිනි.

" ඔයා ගනන් ගන්න එපා අම්මා එයාගේ තාරින්දි දුවට මුකුත් කියන්නේ නෑ නේ.. එන්න යමු කිරි උතුරවනවාත් ඇති දැන්නම්"

සමිත අන්කලුත් අනූ ආන්ටීත් එකතුවී අවුරුදු චාරිත්‍ර අකුරට ම ඉටු කළා. කිරි උතුරවලා කිරිබත් උයලා වැඩ අල්ලලා ගනුදෙනු කරලා අපිත් කෑම මේසයට ආවේ ප්‍රියතම ආහාර අනුභවය කරන්නයි.

" ම්ම්ම් අම්මේ අද නම් කිරිබත් මාර රසයි.. මට නම් මේ ටික කාලා අද දවස ම නිදාගන්න පුලුවන්" චමිරු මල්ලීගේ වසරේ ප්‍රථම ප්‍රකාශයයි ඒ.

" පුතා කලා ඉවර උණ ගමන් ලෑස්ති වෙන්න ඕන ළග ගෙවල්වලට යන්න හෙට අපි යමු අත්තම්මලාගේ ගෙදර "

" හරි අප්පච්චි ඔබතුමා කියන දෙයක් තමා ඉතින්."

ආන්ටිගේ රසවත් ආහර වේල අනුභවයෙන් පසු අපි ලෑස්ති උණේ නෑගම් යෑමටයි. මෙතුලාගේ ගෙදරට උඩින් තිබූ ආච්චිගෙයි සීයාගෙයි ගෙදරටත්, එහා පැත්තෙන් තිබූ ගමට අලුතින් පැමිණි පවුලේ ගෙදරටත් ගිය පසු තරගෙට රතිඤ්ඤා දැමූ පහල ගෙදරට අපි සැවො ම ගියෙමු.

*****

" ආනේ සමිත එන්න ඇතුලට මදූ මේ බලන්න කවුද එන්නේ කියලා" ඒ රතිඤ්ඤා ගෙදර (පහළ ගෙදර) තාත්තායි.

" අනේ මේ අනූෂා නංගිලානේ එන්න නංගි ඇතුලට" ඒ රතිඤ්ඤා ගෙදර අම්මා.

එයද සුන්දර නිවසකි. ඇතුල් වන තැන ම තිබුනේ ප්‍රණීත අවුරුදු කෑම මේසයකි. කෑම කා අවසන් වූ පසු සැම දෙනාම එක්වූයේ සතුටු සාමීච්චි කතාබහටයි. මද වේලාවකින් කතාව එළඹියේ අතීතාවජර්නයකටයි.

" අපේ දුව හිටියානම් දැන් මේ දුවලගේ වයසනේ." මදූ ආන්ටි කිව්වේ සමිත අන්කල් දෙස බලමිනි.

" කවුද ඒ ආන්ටී"

" ඒක දිග කතාවක් පුතේ." මම ආන්ටිගෙන් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු ලැබුනේ අන්කල්ගෙනි.

" අපේ නුලාන් පුතාට පස්සේ අපේ ගෙදරට වාසනාව අරන් ඉපදුනු අපේ දෙවනි ළමයා තමයි විහිනි මගේ පළවෙනි දුව ඒකාලේ මම හිටියේ ට්‍රින්කොවල ක්වාටස් එකේ. අපි එයා ඉපදුනු අලුත් එහෙ ගියේ සතියකින් ආපහු එන්න. දවසක් අපි එහෙදී හැමෝ ම එළියට යන්න හදනකොට නුලාන් කෑගහලා ඇඩුවා එයාට කොහෙවත් යන්න බෑ කියලා. අපි කොහොම හරි එක්කන් යන්න හැදුවත් එන්නම බෑ කියලා ඇඩුවා. ඉතින් ඒක නිසා එයාව ලග ගෙදර හිටපු මගේ යාලුවෙක් ගාව නවත්තලා අපි ගියා. අපි ගමන ගිහින් එන ගමන් ඉද්දී අපිට පිටි පස්සෙන් ආපු ආමි බස් එකක් බ්ලාස්ට් උණා. ඒකෙන් අපේ කාර් එකටත් ඩැමේජ් උණා. අපි දෙන්නටම සිහිය තිබ්බෙ නෑ. පස්සේ හවස හොස්පිට්ල් එකේදී සිහිය ඇවිත් බලපුවාම අපේ විහිනි නෑ. හැම තැනම ගිහින් බැලුවා. අඩුම හැම ඩෙත් බොඩි එකක්මත් චෙක් කලා පස්සේ අපිට හම්බ උණා පොඩි ලමයෙක්ගේ ඩෙත් බොඩි එකක්. ඒත් ගෑණු ළමයෙක්. අපිට තවම විශ්වාස නෑ එයා මැරුණද නැද්ද කියලා." සමිත අන්කල් එහෙම කියනකොට ජනේලෙන් එහා ඇත බලාගෙන කල්පනා කරන මදූ ආන්ටිගේ ඇස් රතුවෙලා කඳුලු පිරිලා තියනවා මම දැක්කා.

පව් මේ ලෝකේ අම්මා තාත්තා නැතුව දුක් විදින මම වගේ ලමයිනුත් දරුවො නැතුව දුක් විදින දෙමව්පියනුත් කොච්චර ඉන්නවා ඇද්ද.

ඒ අමිහිරි කතාවෙන් පස්සේ චමිරු අයියා කල විහිලුවකින් දෙකකින් සියල්ල නැවත යතා තත්වයට පත් විය.

එසේ අවුරුද්ද ද ගෙවී ගොස් සතියකට පමණ පසු මමත් මෙතූත් නැවත විශ්වවිද්‍යාලයට ගියෙමු. නැවතත් සුපුරු පරිදි දින සති ගෙවී ගියේ ය. මම සවස් කාලයේ පෞද්ගලික ස්ථානයක රැකියාවට ගියේ බෝඩිම් ෆීස් ගෙවා ගැනීමට රජයෙන් ලැබෙන මුදල ප්‍රමාණවත් නොවූ නිසායි.එලෙසින් දින සති මාස ගෙවී ගියේ අසුරු නිමේශයෙනි.

*****

# 03.

## වසර තුනකට පසු...

" තාරී ඔන්න එග්සැම් එකේ රිසාල්ට් එනවලු හෙට "

" ඇත්තද මට නම් බයයි මෙතු, අපේ අවුරුදු කීයක මහන්සියද රිපීට් උනොත් නම් මට දරා ගන්න බැරි වෙයි."

" මොනවද අනේ මේ කියන්නේ කැම්පස් එකේ හැමෝම කතා වෙන්නේ ඔයා මේ පාර බැජ් ටොප් වෙයි කියලා"

" හාආආහ් මගේ එකම හීනේ හැබෑ උනොත් හොදයි ඩොක්ටර් කෙනෙක් වෙන එක"

" ඒක අනිවාරෙන් ම හරි යන්වා මැට්ටෝ.. කෝ එන්න මට බඩගිනියි අපි යමු කැන්ටින් එකට ."

" හා මටත් බඩගිනියි."

*****

පසුදින මම උදෙන් ම කැම්පස් එකට ගියේ ප්‍රතිපල දැන ගැනීමේ නොතිත් ආශාවෙනි. එවිටම වාගේ මෙතුත් පැමිනියා ය. මමත් මෙතුත් දෙදෙනාම දැන්වීම් පුවරුව වෙත ගියේ ගැහෙන හදවතිනි.

" තාරින්දී එන්න මාව බදා ගන්න අපේ බැජ් ටොප්....."

මොනවා ඇත්තම ද මේ කියන්නේ...... මේ හීනයක්ද...... මම සිහිනෙන් වාගේ රිසාල්ට් ලිස්ට් එක බැලුවෙමි. දෙවියනේ ඇත්තනේ මගේ නම තමයි උඩින් ම තියෙන්නේ ඉශාරා තාරින්දි. මගේ දෑසින් සතුටු කදුලු බිදු වැටුණේ නොදැනීමය. ඒ කියන්නේ දැන් මම, මම ඩොක්ටර් කෙනෙක්.....

# 04.

මම සිටියේ එංගලන්තයේ නවීන පන්නයේ රෝහලක ශල්‍යාගාරයක රෝගියෙක්ව ශල්‍යකමර්යකට ලක් කරමිනි. මා සිටියේ හෙදියන් කිහිප දෙනෙකුත් මට වඩා අත්දැකීම් බහුල වෛද්‍යවරුන් කිහිප දෙනෙකුත් වට කර ගෙනය. හදිසි අනතුරකින් පසුව රෝහලට රැගෙන ආ රෝගියා නම් සිටියේ බේරා ගත හැකි තත්වයකයි. මම හැකි විගස මගේ උපරිමය කිරීමට පෙළඹුනෙමි.

ලංකාවේදී පැවති උපාදි ප්‍රදානෝත්සවයේදී මට මාස හයක පුහුණුවක්ද සමග වසර හතරක සේවා කාලයක් සදහා එංගලන්තයේ සුප්‍රසිද්ද රෝහලකට යැමට වරම් ලැබුණි.

ඒත් ඊට පසුදිනයේ උදෑසන ම මට ලැබුණේ ශෝකජනක ආරංචියකි. ඒ අපේ අනාථ නිවාසයේ අපේ මිස් එදින උදයේ හෘද්‍යාබාදයකින් මිය ගොස් ඇති බවයි. දැනගත් විගසම මම අනාථ නිවාසයට ගියෙමි. ඇගේ නිසල සිරුර බදා ගෙන මම මගේ සියලු දුක් කදුලේ දිය කර හැරියෙමි. ඇගේ දානයට පෙර දින කාමර අස් කරන විට මගේ නම ලියූ ලියුම් කවරයක් දැක එය විවෘත කර බැලුවෙමි. එහි තිබුනේ ලොකට් එකකි සැලෙන හදින් යුතුව මම එය ද විවෘත කලෙමි. එහි වූයේ කාන්තාවක් සහ පිරිමියෙක්කුඩා දරුවෙකු වඩා ගෙන සිටින පින්තූරයකි. ලියුම් කවරයේ කොල කැබල්ලක මෙසේ ලියා තිබුණි.

*තාරින්දි දුව,*

*මම ඔයාව හොයා ගන්නකොට ඔයාගේ බෙල්ලේ මේක*

*දාලයි තිබුනේ ඔයාට ටිකක් තුවාල වෙලායි හිටියේ මම ඔයාව වඩාගෙන*

*ලග ඔයාගේ කවුරු හරි ඉන්නවද බලද්දී ලග හිටපු අම්මයි තාත්තයි*

*හුස්ම ගත්තේ නෑ ඉතින් මම ඔයාව අපේ අනාථ නිවාසෙට එක්කන්*

*ආවා ඔයා ලොකු උණාම දෙන්නයි මේක තියාගෙන හිටියේ. හැමදාම*

*සතුටින් පරිස්සමින් ඉන්න.*

*විශාකා මිස්.*

මම නැවතත් ලොකට් එක ඇර බැලුවෙමි. දැකලා පුරුදුයි වගේනේ. දෙවියනේ මේ සමිත අන්කලුයි අනූ ආන්ටියී නේද. එතකොට එයාල ද මගේ අම්මයි තාත්තයි. අනේ අනේ..... මගේ දෑස් කදුලින් තෙත් වූයේ නොදැනීම ය. ඒ ලස්සන පුංචි ගෙදර මගේ ම කියලා අම්මා කෙනෙකුයි තාත්තා කෙනෙකුයි එක්ක මගේ ම අයියායි නංගී එක්ක, අනේ හිතනකොටත් මගේ මගේ හදවත රිදෙනවා වගේ.. අනේ ඇයි මට ම එහෙම උනේ කොච්චර ලස්සනට සතුටින් ජීවත් වෙන්න තිබ්බද මට. අනික, අනික මෙතූ මගේ උඩ ගෙදර... මම කොච්චර නම් අවාසනාවන්තද?

ඇයි එහෙම උනේ, අනේ විශාකා මිස්ට මාව එක්කන් එන්න හිතුනේ නැත්තන්. එහෙම උණා නම් මම අද මගේ පවුලක් එක්ක සතුටින්. ඒත් විශාක මිස් මට කලේ හොඳක් නේ. ඒත් ඒ වෙලාවේ අම්මටයි තාත්තටයි සිහිය තිබ්බනම්. එහෙම උණා නම්..... හහ් දැන් ඒවා ගැන හිතලා වැඩක් නෑ. ඒත්, ඒත් දැන් මම මොකක්ද කරන්න ඕන. මම ගිහින් කියනවද මම එයාලගේ දුව කියලා. ඒත් එහෙම උනොත් එයාල හදා ගත්ත ලස්සන පවුලට මොකද වෙන්නේ. මම එයාලට ආගන්තුකයෙක් වෙනවා. අනික අපි අවුරුද්දට ගියපුවා ම අම්මයි අප්පච්චී කිව්වේ ලගදි ම එයාලගේ දේපලත් බෙදලා ඒ දෙන්නා හිතේ හැටියට ට්‍රැවල් කරනවා කියලා. එතනට මම ගියොත් ප්‍රශ්නයක් නේ ඇති වෙන්නේ. මට මේ ඉන්න විදිහ හොදයි. මම ඈත ඉදන් එයාලා දිහා බලන් ඉන්නවා. ඕනිම වෙලාවට එයාල ළගම ඉන්නවා. ඒත් ඇත්ත කියන්නේ නෑ. ඒක මට හිතට සැනසීමක්. එහෙම හොදයි මේ ආත්මෙදි මට මේ විදිහ හොදයි. හ්ම්ම්ම් හාආහ්.

*****

මම ඉශාරා තාරින්දි. ඒත් ඇත්තට ම විහිනි චමල්ශා විජේබණ්ඩාර.

මගේය කියා කීමට තරම් දෙයක් නොතිබූ මට ඇත්ත දැන ගැනීමෙන් පසු අම්මාත් අප්පච්චීත් හැර දා රට යෑම මහත් දුකක් විය. ඔවුන් ඇත්ත නොදැන සිටියත් මට ඔවුන් බැලීමට යෑමටවත් නොහැකි වන්නේය. ප්‍රාණසම මිතුරිය වූ මෙතුලිනීව හැර යාමත් එවැනි ම දුකකි. මට නම් හිතෙන්නේ දේවල් ලැබෙනවාට වඩා ඉක්මනින් නැති වෙලා යන එක මගේ දෛවය ද කොහෙද.

මම අතීතාවජර්නයෙන් මිදී නැවතත් පියවි සිහියට පැමිණියෙමි. රෝගියාට ප්‍රතිකාර කිරීම ඇරඹුවෙමි.

*****

අම්මලාට ඇත්ත නොකීමට මම ගත් තීරණය වඩාත් යෝග්‍ය බව මට සිතුනේ ඔවුන් දෙදෙනා සියලු දේපළ අයියාටත් නංගීටත් බෙදා දී නිවාඩුවක් ගත කිරීමට එංගලන්තයට පැමිණෙන බව මෙතුගෙන් දැගත් පසුව ය. මගේ අම්මා මදූ විජේබණ්ඩාර බවත් තාත්තා සමිත විජේබණ්ඩාර බවත් මෙතු දන්නේ නැත. මං ගැන මේ ලෝකේ හොදට ම දන්න කෙනා මෙතු උනත් එයා මේ වෙලාවේ හිතන්නේ මගේ යහපත ගැන විතරයි. එයා මේ ගැන දැනගත්තොතින් අනිවාරෙන් ම අම්මටත් අප්පච්චීටත් මේ ගැන කියනවා. ඒකෙන් වෙන්නේ කුරුලු කූඩුවක් වගේ තියන ඒ පවුලේ හැම දේම කන පිට පෙරලෙන එකයි. ඉතින් දැන් මම බලන් ඉන්නේ ඒ දෙන්නා මෙහෙට එනකන්.

පසුදින උදයේ සුපුරුදු පරිදි මම රෝහලට ගියෙමි. සවස් කාලය වන විට මම හිටියේ හොදටම හෙම්බත් වීය. ඈතින් හෙදියක් දිව එනු මම දුටුවෙමි. ම්ම්ම් තවත් පේශන්ට් කෙනෙක් ද කොහේද මමත් දුවගෙන එලියට ගියෙමි. ගිලන්රථ දෙකක් එහි නතර කර තිබුණි. එයින් පිටතට ගිලන් ඇදක් තල්ලු කරගෙන එනු දුටු මම සුපුරුදු පරිදි වෙද නළාව ලෑස්ති කර ගතිමි.

මො..මො..මොනවා අම්මා. ඒ ගිලන් ඇද මත වැතිර සිටි කාන්තාව මදූ විජේබණ්ඩාරයි.

මම වේගයෙන් ඊළග ගිලන් ඇද දෙසට ගියෙමි. මගේ උපකල්පනය නිවැරදි විය ඒ සිටියේ මගේ තාත්තායි. මේ අවුරුදු දෙකහමාරක පමණ කාලය තුළ ලෙඩුන් සියයක් පමණ සුවපත් කර තිබූ

මගේ දැත් වෙව්ලීමට ගත්තේ ඉබේම ය. මම සිහියෙන් සියල්ල දරාගෙන සිටිය යුතු වේලවක මගේම ශරීරය මෙලෙස ප්‍රතික්‍රියා කිරීම කෝපය දනවනසුලු දෙයක් විය.

" ඩොක්ටර් අපි තියටර් එක ලෑස්ති කළා ඩොක්ටත් ඉක්මනට එන්න. ටෝනි ඩොක්ටර් ඔපරේශන් එක පටන් ගන්නයි යන්නේ ." ඒ මීම හැරුණු විට මේ රෝහලේ සේවය කරන එකම ශ්‍රී ලාංකික හෙදියයි.

" මට පේශන්ට්ලගේ කන්ඩිශන්ස් කියන්වද" මම ඇසුවේ ගැහෙන හදිනි.

" ලොකු ඩැමේජ් එකක් නම් නෑ ඩොක්ටර් මේල් පේශන්ට්ගේ කකුල ඩැමේජ් වෙලා තියනවා ෆීමේල් කෙනාගේ අතට ඩැමේජ් වෙලා වෙනනම් පොඩි පොඩි තුවාල ඇරෙන්න ලොකු ඩැමේජ් එකක් නැහැ."

"හරි නන්දනී මම ඉක්මනට එන්නම් "

ගැහෙන දෑතින් යුතුව වේගයෙන් මම ශල්‍යාගරයට ගියෙමි. එවිටද ජේෂ්ඨ වෛද්‍යවරයෙකු වූ ටෝනි ඩොක්ටවරීසින් ශල්‍යකමර්ය අරඹා තිබුණි. එම නිසා මම සැනසුම් සුසුම් හෙලුවෙමි.

*****

# 05.

එම අවාසනාවන්ත සිද්ධියේත් රිදී රේඛාවත් තිබුණි. ඒ අනතුරින් පසුව අම්මාත් අප්පච්චීත් මාත් සමග තුවාල සුව වෙනතුරු සිටීමට කැමති විය. දැන් මට ඔවුන්ටද නොදැනෙන ලෙස ඔවුන් සමගම සිටීමට හැකිවේ. අම්මාවත් අප්පච්චිවත් ආදරෙන් රැක බලා ගැනීමට හැකිවේ. ඉතින් දැන් මං සතුටින් මගේ බලාපොරොත්තු ඔක්කොම ඉශ්ඨ වෙන ගමනුයි තියෙන්නේ...

" තාරින්දි දුව මිම්ම් කෑම නම් හරිම රසයි. කොහොමද දුව උයන්න ඉගන ගත්තේ. "

" මම දන්න කාලෙක ඉදලා හිටියේ අනාථ නිවාසේ ඉතින් ටිකක් ලොකු උණ ගමන් මම උයන්න ඉගනගත්තා ආන්ටි, ඉන්න මම තව ටිකක් බෙදන්නම්."

" එතකොට දුව කවදාවත් ම දුවගේ අම්මලා තාත්තලාව හෙව්වේ නැද්ද?"

" මම හෙව්වා අන්කල් ඒත් මම හම්බ උනත් එයාලා ගාවට යන්නේ එයාලට වෙන කිසිම ළමයෙක් නැත්තන් විතරයි. මොකද කොහේවත් ඉන්න මම එතනට ගිහින් ඒ පවුල කනපිට පෙරලන එක හොද දෙයක් නෙවෙයි. අනික මට එහෙම කරන්න හිතෙන්නෙත් නැහැ මම හිටපු මේ විදිහ හොදයි මට ඉතුරු ටිකත් ජීවත් වෙන්න."

" දුව ගොඩාක් දුර දිග හිතලා වගේ. ඒත් දුව ඔයා තනි වෙලා නෑ කිසිම දේකට ආය හැම දේකට ම මමයි මදූ ආන්ටියි ඉන්නවා පුතේ.'

ඒ වචන ටික ඇසීමෙන් මට කදුලු වැටුණි.

" අනේ ඒ වචන ටිකත් මට ඇති අන්කල් මේ ජීවිත කාලෙට ම. දැන් නම් මම හෙට මැරුණත් කමක් නෑ. මං වෙනුවෙන් අඩන්න මේ ලෝකේ කවුරු හරි ඉන්නවනේ. අන්කල් අහලා ඇතිනේ ප්‍රසිද්ද ඉංග්‍රීසි කියමනක් තියනවා ඉපදෙනකොට අපි අඩනවා අනිත් හැමෝම හිනා වෙනවා මැරෙද්දී ඒකෙ අනිත් පැත්ත ඒ කියන්නේ අපි හිනා වෙලා මැරිලා අනිත් අය අපි වෙනුවෙන් දුක් වෙන්න සලස්වවුවොත් අපි මේ ජීවිතේ දිනලා කියලා. "

" ඔව් පුතේ පුතා අපිව මේ බලා ගන්න පිනම ඇති පුතාට ලබන ආත්මේ මීට වඩා හොද ජීවිතයක් ලැබෙන්න."

" මම නම් ප්‍රාථර්නා කරන්නේ ලබන ආත්මේ මට අන්කලුයි ආන්ටියි වගේ අම්මෙකුයි තාත්තෙකුයි ලැබෙන්න කියලා." මම මගේ අවංක අදහස කිව්වෙමි.

*****

කාලය කෙමෙන් ගෙවී ගොස් අම්මාත් අප්පච්චීත් නැවතත් ලංකාවට ගියේ කලින් සැලසුම් කල නිවාඩුව ගතකිරීමෙන් පසුවය. නැවතත් සුපුරුදු පරිදි මම තනි වීමි. දැන් මෙතූත් විවාහ වීය. ඇගේ විවාහ මංගල්‍යාටවත් මට සහභාගී වීමට නොහැකි වූයේ නිවාඩු ලබා ගත නොහැකි වූ නිසාය.

තව සතියකින් මමත් නැවතත් ලංකාවට යමි. කොළඹ රෝහලෙන් මට දැනටමත් රැකියාව ලැබී ඇත. සෑම මාසයක ම මගේ පඩියෙන් භාගයක් අපේ අනාථ නිවසේ ගිණුමට බැර කිරීමට මම ඉටා ගතිමි.

*****

මම සිටියේ ගුවන්තොටුපලේ බැහැර වීමේ අංශයේය. ඈතින් මිනිසුන් තම නෑදෑයන් එනතුරු බලාපොරොත්තු දල්වා ගෙන බාලා සිටියි. සමහරුන් තම ප්‍රියතමයන් අතහැර යාමට නොහැකිව කඳුලු සලයි. ගුවන්‍යානයෙන් බැස එන සමහරුන් සියලු බලා පොරොත්තු සපල වූ ආකාරයට සතුටින් ගමන් කරයි. තවත් සමහරුන් තම පසමීපතමයන් සමග සතුටින් ඇවිද යයි. ඒ අතර මා වැනි කවුරුත් නැතිව තනිව ඇවිදගෙන යන්නවුන් ද ඇත. ඇත්තට ම මේ ජීවිතය කියන්නේ තනියම ඇවිදගෙන ඇවිත් අත් අල්ලන් ඉදලා අත් අත් ඇරලා යන ගමනක්. ඒ අතර අපට හමු වෙන මිනිසුන් සිහිනයක් සේ අපේ ජීවිතයට ඇවිත් යන අයුරු මට සිහි වූයේ කොළඹට යාමට කුලී රථයකට අත දමන විටදී ය.

නිමි.

## කතර්ෘගෙන් සටහනක්.

මේ කතාව නිමි කියා තිතක් තැබුවද
මෙය කාගේ වුවද ජීවිත කාතාව
හැක.  අනාගතයේ වීමට නියමිත
විය හැක. එමෙන් ම සෑම
මිනිසෙකුගේ ජීවන යතාථර්ය ද
මෙසේ විය හැක. සිහිනයක් සේ
ජීවිතයට ඇවිත් යන මිනිසුන් ඇවිත්
හිදින සුලු මොහොතේ සතුටින්
ජීවත් වෙමු.

## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN** 978-624-211-439-2